## ලාභ අරමුණු කර නොගත් සංවිධාන

### I - කොටස

- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

❖ **නිවැරදි පිළිතුර තෝරන්න.**

01. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් සඳහා උදාහරණයකි,

(1). නිමල් ස්ටෝර්ස් (3). රතුකුරුස සංවිධානය
(2). මිල්කෝ සමාගම (4). ඖෂධ සංස්ථාව

02. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ආදායම් ප්‍රකාශයේ වියදමට වඩා ආදායම වැඩි වූ විට එය ව්‍යාපාරයේ,

(1). අතිරික්තය වේ (3). දළ ලාභය වේ
(2). ශුද්ධ ලාභය වේ (4). ඌණතාවය වේ

03. එකමුතු යොවුන් සමාජයේ සාමාජිකයන් සංඛ්‍යාව 120 කි. එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 200 කි. 2019.12.31 වන විට එම වසර සඳහා සාමාජිකයන් 100 ක් මුදල් ගෙවා ඇත.

04. ඉහත තොරතුරු අනුව එකමුතු යොවුන් සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කළ යුතු අගය වනුයේ,

(1). රු. 20 000 (2). රු. 44 000 (3). රු. 4 000 (4). රු. 24 000

05. ඉහත තොරතුරු අනුව එකමුතු යෞවන සමාජයේ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල් ප්‍රමාණය,

(1). රු. 20 000 (2). රු. 4 000 (3). රු. 24 000 (4). රු. 12 000

## II - කොටස

- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක අරමුදල් සම්පාදනය කරගත හැකි ආකාර 03 ක් ලියන්න.

02. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

➢ ලාභ අරමුණු කර නොගත් සංවිධානයන්හි,

(i). ලැබීම් හා ගෙවීම් ගිණුම
(ii). ආදායම් ප්‍රකාශනය

03. තුරු සෙවන ප්‍රජා සංවිධානයේ 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ ගනුදෙනු පහත දක්වේ.

04. තුරු සෙවන ප්‍රජා සංවිධානයේ 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ ගනුදෙනු පහත දක්වේ.

| | | | |
|---|---|---|---|
| පරිත්‍යාග ලැබීම් | 25 000 | ලිපිද්‍රව්‍ය | 1 200 |
| පරිපාලන වේතන | 8 000 | විදුලි බිල් ගෙවීම | 500 |
| කොඩි වලින් ලද මුදල් | 2 000 | තැපැල් ගාස්තු | 550 |
| සඟරා විකිණීමේ මුදල් | 15 000 | ශිෂ්‍යාධාර ලබාදීම | 3 500 |
| ප්‍රජා ශාලාව අළුත්වැඩියාව | 8 000 | ස්වයං රැකියා ආධාර ලබාදීම | 1 200 |
| 2019.01.01 මුදල් ශේෂය | 8 000 | | |

අතිරේක තොරතුරු,

(1). සංවිධානයේ මුළු සාමාජික සංඛ්‍යාව 100 කි. එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 500 කි. සාමාජිකයින් 10 දෙනෙකු මුදල් ගෙවා නොමැත.

(2). ඉදිරියට ගෙවූ විදුලිය රු. 400, ගෙ/යුතු දුරකථන බිල රු. 450 කි.

(3). වත්කම් තොරතුරු

| | 2019.12.31 | 2019.01.01 |
|---|---|---|
| උපකරණ | 18 500 | 20 500 |
| ලී බඩු | 15 200 | 16 100 |

➢ ඉහත තොරතුරු භාවිතා කරමින් තුරු සෙවන සංවිධානයේ 2019.12.31 දිනට ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

***සැකසුම : ඉමේෂා ලක්ෂ්මන්***